# සඳකඩ පහණ පිළිබඳ මූලික විමසුමක්

*චන්දන රෝහණ විතානච්චි*

## ප්‍රවේශය

ඉපැරණි දේශීය කැටයම් කලාවේ සුවිශේෂී ස්ථානයක් ගනු ලබන සඳකඩ පහණ මෙරට කැටයම්කරුවන්ගේ කලාත්මක හැකියාව පෙන්නුම් කරන ප්‍රධාන අංගයකි.[1] පැරණි ගොඩනැගිලි ආශ්‍රිතව හඳුනාගත හැකි වැදගත් තාක්ෂණික නිර්මාණයක් වන්නේ පියගැට පෙළයි. විශේෂයෙන් ම ගොඩනැගිල්ලට පිවිසීමේ පහසුව උදෙසා නිර්මාණය කර තිබෙන පියගැටපෙළෙහි පවතින්නා වූ සුවිශේෂ නිර්මාණ ලක්ෂණ නිසා එය වෙනම සංකීර්ණයක් ලෙස ද ඇතමුන් විසින් සළකනු ලැබේ. වෙන වෙනම නිර්මාණය කරන ලද ගල්පඩි එකිනෙකට බද්ධ වන පරිද්දෙන් සම්බන්ධ කර තිබෙන පියගැට පෙළේ එම ගල්පඩි දෙපසට තල්ලුවීම වැළැක්වීම පිණිස යොදන ලද ආධාරකය කොරවක්ගල ලෙසින් ද එකී කොරවක්ගල ඉදිරියට තල්ලුවීම සඳහා යොදන ලද ආධාරක පුවරු මුරගල් ලෙසින් ද පියගැට පෙළේ ගල්පඩි ඉදිරියට තල්ලුවීම වැළැක්වීමට යොදන ලද ආධාරකය සඳකඩ පහණ ලෙසින්ද හඳුන්වනු ලබයි. සඳකඩ පහණ මතුපිටින් ඉතා සුළු කොටසක් පමණක් දිස්වන ආකාරයට දක්නට ලැබුණ ද එහි අභ්‍යන්තරයට විශාල කොටසක් පොළවේ ගිල්වා තිබෙන ආකාරයක් හඳුනාගැනීමට පුළුවන. එලෙස ගිල්වීමක් සිදුකර ඇත්තේ සඳකඩ පහණට ස්ථාවරත්වයක් ලබාදීම සඳහා හා සමස්ථ පියගැටපෙළින් ලැබෙන පීඩනය දරා සිටීමට බව පැහැදිළි ය. මීට අමතරව මෙය පියගැටපෙළේ පළමු පඩිය ලෙසින් ද ක්‍රියාත්මක වී තිබෙන බව හඳුනාගැනීමට පුළුවන. මෙය පාපිස්නක් ලෙසින් ක්‍රියාත්මක වූ තාක්ෂණික ව්‍යුහයක් වන බව පෙනේ.[2]

පැරණි පියගැටපෙළ එනම් පැරණි පියගැටපෙළ පහළ කෙළවර පිහිටි මෙම නිර්මාණය මුල්කාලීනව ආයත චතුරස්‍රාකාරව නිර්මාණයකර තිබෙන බව වෙස්සගිරිය, අභයගිරිය ආදි ස්ථානවල තිබෙන නිදසුන්වලින් තහවුරු වේ. එම හැඩයට මෙම ආරම්භක අවස්ථාවේ කලා නිර්මාණයක් ලෙසින් නොව තාක්ෂණික නිර්මාණයක් ලෙසින් ආරම්භ වූ බවට නිදසුනක් වේ. කෙසේ වෙතත් පසුව බෞද්ධාගමික ස්ථාන සඳහා කලාව සම්බන්ධවීමේ ප්‍රතිඵලයක් ලෙස සඳකඩ පහණ ඇතුළු පියග ැටපෙළ සංකීර්ණය ද කලාත්මක නිර්මාණයක් ලෙසින් වර්ධනය වී තිබේ. ඒ අනුව එහි කෙළවර නෙත් කී තරමක් හැඩගැන්වීමකට ලක් වූ අතර පසුව එය අඩසඳ හැඩති ගල් පුවරුවක් බවට පත් වී තිබේ. එහි ආරම්භක අවස්ථාවේ දී කැටයම් රහිත චාම් බවක් දක්නට ලැබෙන අතර ඒ සඳහා නිදසුන් ඉහත කී ස්ථානවලින් ම හඳුනාගැනීමට පුළුවන.

මහාවග්ගපාලියේ ගොඩනැගිලි දොරටුවක පඩිපෙළ කෙළවර තබන ලද පාටිකාවක් පිළිබඳව සඳහන් වේ.[3] පාලි හා සාහිත්‍යය ග්‍රන්ථවල සඳකඩ පහණ පිළිබඳව සඳහන් වන ස්ථාන ගණනාවක් වේ. විශාඛා උපාසිකාව විසින් සැවැත් නුවර පුබ්බාරාමය බුදුන් වහන්සේට පූජාකිරීම දැක්වෙන විස්තරයෙහි බුදුන්වහන්සේ එහි පියගැටපෙළත් පාදෝනියටත් අතර පිහිටි ස්ථානයක සිටි බව දැක්වේ.

---

1 සී. වික්‍රමගමගේ, **ශ්‍රී ලංකාවේ පැරණි ගොඩනැගිලි දොරටු**, (කොළඹ: ලංකා සංස්කෘතික ශාස්ත්‍රායතනය, 1995), 10 පිට.

2 මහාවංසය, (සිංහල සංස්.), හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි සහ බටුවන්තුඩාවේ දේවරක්ෂිත පඬිතුමා, (කොළඹ: රත්නාකර පොත් වෙළඳ ශාලාව, 1967), xxxi: 60-1 පිටු.

3 මහවග්ගපාලි, බුද්ධ ජයන්ති සංස්කරණය, (කොළඹ: 1957), 237 පිට.

එකී ස්ථානය සම්බන්ධයෙන් හැඟී යන්නේ එය සඳකඩ පහණ වන බවයි. ක්‍රි.ව. 05 සියවසේ ලියවුණු **ධම්මපදට්ඨකතාවේ** සෝපානය යනුවෙන් ද, 10 සියවසේ රචනා කරන ලද **දම්පියා අටුවා ගැටපදයේ** පියගැට යනුවෙන් ද යෙදී ඇත.

12 සියවසට අයත් **අමාවතුරහි** අඩසඳපහණ ලෙසින් මුලින් ම පැහැදිලිව දක්වා තිබේ.[4] **සද්ධර්මරත්නාවලියේ** මෙකී නිර්මාණය සඳකඩපාණ, සඳකඩ පහණ යනුවෙන් සඳහන් කර ඇත.[5] **වංසත්ථප්පකාසිනියේ** මහාවංසයේ සඳහන් **පාඨික** යන්නට ටීකා සපයමින් එය **අඩසඳ හැඩැති ගලක්** වශයෙන් විස්තර කර තිබේ.[6] එහි **පදගණ්ඨිකා** හෙවත් පියගැටය ලෙස ද සඳහන් කර ඇති බව වික්‍රමගමගේ දක්වා තිබේ.[7] **සිංහල ථූපවංසයේ** ගල් පුවරුවක් මත ඇති රූකම් පිළිබඳව විස්තර කර ඇත. **අභිධානප්පදීපිකා සන්නයේ** සඳකඩ පහණ යනුවෙන් සඳහන් කර ඇත.[8] **සමන්තපාසාදිකා විනය අටුවාවේ** පාඨික යනු පඩිපෙළ මුල ඇති **අඩ්ඪචන්ද පාෂාණය**" ලෙස හඳුන්වා තිබේ.[9] **විමතිවිනෝදනීයේ** ''අඩ්ඪචන්ද පාෂාණය" විස්තර කර ඇත්තේ කවාකාර ගල් පුවරුවක් ලෙසිනි. **සමන්තපාසාදිකාව, සුමංගල විලාසිනිය, බ්‍රහ්මජාල සූත්‍ර සන්නය** වැනි කෘතිවල බුදුන් වහන්සේ හා භික්ෂූන් වහන්සේලා පඩිපෙළ ළඟ පිහිටි මෙම ගල් පුවරුව මත සිට පා දෝවනය කළ බව සඳහන් වේ. **පන්සියපනස් ජාතක පොතේ** දැක්වෙන්නේ ද සඳකඩ පහණ යනුවෙනි.[10] මේ ආකාරයට විවිධ මූලාශ්‍රය වලින් මේ සම්බන්ධයෙන් තොරතුරු සඳහන් වීමෙන් පැහැදිලි වන්නේ සඳකඩ පහණ යනු සමාජය විසින් පිළිගත් ශෛලමය නිර්මාණයක් වන බවයි.

රූකම් රහිත ආයත චතුරස්‍රාකාර සඳකඩපහණේ ජේතවනාරාම පංචායතන සංකීර්ණයෙහි ද දක්නට ලැබේ. ඒ අනුව එම හැඩ සඳකඩපහණේ විකාශනයේ මුල්ම අවස්ථාව ලෙස සලකනු ලබයි. චන්ද්‍රවික්‍රමගමගේ පවසන්නේ පියගැටපෙළ පාමුල තිබෙන අර්ධ වෘත්තාකාර ගල් පුවරුව "**පාඨික**" විය හැකි බවයි.[11]

ඉන්දියාවේ ආන්ද්‍ර දේශයේ නාගර්ජනිකොණ්ඩ වැනි ස්ථානයන්හි සඳකඩ පහණ වල ලංකාවේ සඳකඩ පහණ මෙන් කැටයම් සහිත බවත් දක්නට ලැබේ. එය පදනම් කර ගනිමින් පරණවිතාන අවිනිශ්චිත ස්වභාවයකින් යුතුව පවසා සිටින්නේ ලංකාවේ සඳකඩ පහණ ආන්ද්‍ර ආභාෂයකින් යුතුව නිර්මාණය වන්නට ඇති බවයි. සඳකඩ පහණ වලට නිදසුන් ආන්ද්‍ර දේශයේ ස්ථාන කිහිපයකින් ම හමු වී ඇත.[12] කෙසේ වෙතත් ඉන්දියාවෙන් හමු වී තිබෙන හොඳම සඳකඩ පහණ පිහිටා ඇත්තේ නාගර්ජනි කොණ්ඩයේ සිංහලාරාමයේ ය. ඇතැම් විට මෙය ලංකාවේ ආභාෂය මත නිර්මාණය වූවක් විය හැකි ය. රූකම් කිසිවක් නැති අර්ධවෘත්තාකාර සඳකඩ පහණ කිහිපයක් සාංචිය හා තවත් ස්ථාන කිහිපයකත් දැකගත හැකි ය. අමරාවතිය, ජග්ගයියාපේඨය වැනි ස්ථානවල තිබෙන කැටයම් ආශ්‍රිතව පියගැටපෙළ දක්වා තිබෙන ස්ථානයන් හි සඳකඩ පහණ ද නිර්මාණය කොට ඇත. අජන්තා, කාර්ලේ සහ එල්ලෝරාවේ සඳකඩ පහණ දක්නට ලැබේ.[13] ඒවා ස්වභාවික ගලෙහිම කැටයම් කරන ලද නිර්මාණ විය.

සාමාන්‍යයෙන් සඳකඩ පහණ පියගැටපෙළේ ආරක්ෂිත කොටස වශයෙන් තරමක් විශාල තනි ගල් පුවරුවක් භාවිතයෙන් නිර්මාණය කළා වුව ද පළලින් වැඩි විශාල පියගැට පෙළක් සඳහා එවැනි පුවරුවකින් සඳකඩ පහණ සැකසීම අසීරු කාරණයක් විය. මේ නිසා සිදු කොට ඇත්තේ ගල් කැබලි එකතු කොට අර්ධ වෘත්තාකාරව පෙළගස්සවා සඳකඩ පහණ නිර්මාණය කරලීමයි. අභයගිරියේ දාගැබ් මළුවට පිවිසෙන ප්‍රධාන පියගැටපෙළ ආශ්‍රිත ව එවැනි සඳකඩ පහණේ දැකගත හැකි ය. කෙසේ

---

4 **අමාවතුර,** (සංස්.), වැලිවිටියේ සෝරත හිමි, (කොළඹ: 1948), 154 පිට.

5 **සද්ධර්මරත්නාවලිය,** ඩී. බී. ජයතිලක සංස්කරණය, (කොළඹ: 1925), 387 පිට.

6 **වංසත්ථප්පකාසිනී, (මහාවංස ටීකාව),** ජී.පී. මලලසේකර සංස්කරණය, (ලන්ඩන්: 1935), 572 පිට.

7 සී. වික්‍රමගමගේ, **ශ්‍රී ලංකාවේ පැරණි ගොඩනැගිලි දොරටු,** (කොළඹ: ලංකා සංස්කෘතික ශාස්ත්‍රායතනය, 1995), 13 පිට.

8 **අභිධානප්පදීපිකා සන්නය,** (සංස්.), පඤ්ඤාතිස්ස හිමි, (කොළඹ: 1885), 31 පිට.

9 ටී. ඩී. දේවේන්ද්‍ර, **සඳකඩ පහණ සහ වෙනත් ලිපි,** (කොළඹ: එස්. ගොඩගේ සහ සමාගම, 2007), 81 පිට.

10 **පන්සිය පනස් ජාතක පොත,** (සංස්.), පේමානන්ද හිමි, (කොළඹ: 1959), 174 පිට.

11 සී. වික්‍රමගමගේ, **ශ්‍රී ලංකාවේ පැරණි ගොඩනැගිලි දොරටු,** (කොළඹ: ලංකා සංස්කෘතික ශාස්ත්‍රායතනය, 1995), 15 පිට.

12 **එම.,**

13 **එම.,**

වෙතත් මේ ආකාරයේ කුඩා සඳකඩ පහණ මාළිගාවිල ද දක්නට ලැබේ. ඒ අනුව පැහැදිළි වන්නේ සඳකඩ පහණ තනි ගලකින් නෙලීම සම්මත කාරණයක් ව නොපැවති බවකි.

ක්‍රිස්තු වර්ෂ 13 සියවස දක්වා සඳකඩ පහණ අර්ධකවාකාර ස්වරූපයකින් පැවතී ඇත. එහෙත් ඉන් පසුව සඳකඩපහණේ ස්වරූපය වටකුරු වන්නට වූ අතර ක්‍රමයෙන් එය පූර්ණ වෘත්තයක ආකාරයට සමීප වන්නට විය. දඹදෙණි යුගයට අයත් බෙලිගල සඳකඩ පහණ මෙයට නිදසුනකි. තවත් කල්යාමේ දී එයට ඉදිරි පැන්නුමක් ලෙසින් වෘත්තාකාර පඩියක ස්වරූපයක් එකතු කර ඇති ආකාරයක් හඳුනාග ැනීමට පුළුවන. මෙම තත්ත්වය ගම්පොළ යුගයේ දී හඳුනාගත හැකි අතර හොරණ රජමහ විහාරයේ තිබෙන මෙම යුගයට අයත් සඳකඩ පහණ ඒ සඳහා නිදසුනකි. එමෙන්ම මෙහි කලාත්මක ස්වභාවය ද හීන වී ගිය ස්වරූපයක් පෙන්නුම් කරයි. මහනුවර යුගය වන විට සඳකඩ පහණ තරමක ත්‍රිකෝණාකාර ස්වරූපයකට ආසන්න වී තිබෙන අතර එහි ඉදිරිපස මැදින් එම හැඩය පටන්ගෙන තිබෙන බවක් හඳුනාගැනීමට පුළුවන. දෙගල්දොරුව, මඟුල් මඩුව, දළදා මාළිගය ආශ්‍රිත ව මෙවැනි සඳකඩ පහණ දැකගැනීමට පුළුවන.

සඳකඩ පහණ පිළිබඳ විස්තර ක්‍රි.පූ. 3 සියවස සිටම පැවතුන බවට තොරතුරු ලැබුණ ද ඒවායෙහි කාලනිර්ණය සම්බන්ධයෙන් නිශ්චිත අදහසක් ඇතිකර ගැනීමේ හැකියාවක් නොපවතී. අභයගිරියේ ඇති පොකුණට බටහිරින් පිහිටි දීඝ පාෂාණ ගොඩනැගිල්ල සමීපයේ ඇති පංචායතන සංකීරණය ද, අභයගිරි විහාර පරිශ්‍රයෙන් ද ආයත චතුරස්‍රාකාර සඳකඩ පහණ හමු වී ඇත. මින් අභයගිරියේ නිර්මාණ 3ක් රළු ස්වභාවයක් ගන්නා බැවින් ඒවා ක්‍රි.ව. 1-5 සියවස දක්වා කාලයට අයත් විය හැකි බව ඇතැම් විද්වතුන් පෙන්වා දී තිබේ. චාල්ස් ගොඩකුඹුර ප්‍රකාශ කරනුයේ ගල් කැබලි එක්කොට තැනුණු අභයගිරියේ සඳකඩ පහණ ක්‍රි.පූ. 1 සියවසට අයත් විය හැකි බවයි.

සඳකඩ පහණ සම්බන්ධයෙන් නිවැරදිව කාල නිර්ණය කිරීම ගැටළුවකි. සීගිරියෙන් ලැබී තිබෙන ක්‍රි.ව. 5 සියවස අයත් යැයි කාලනිර්ණය කළ හැකි සඳකඩ පහණ වලට සමාන සඳකඩ පහණ වෙස්සගිරියෙන් හා හත්තිකුච්චියෙන් හමු වී තිබේ. සඳකඩ පහණහි කාලනිර්ණය සම්බන්ධයෙන් කිසියම් නිශ්චිත අදහසකට එළඹිය හැකි සෙල්ලිපි සහිත සඳකඩ පහණ කිහිපයක් මිහින්තලයේ සන්නිපාත ශාලාව, වෙස්සගිරිය, තිසාවැව, නොච්චිකුලම, පන්කුලිය වැනි ස්ථානවලින් හමුවී තිබේ. මෙකී සෙල්ලිපි හා සඳකඩ පහණ් අතර පැහැදිලි සම්බන්ධතාවක් නොතිබුණ ද එම ලිපිවල අක්ෂර අනුව මෙකී සඳකඩ පහණ ක්‍රි.ව. 5,6 සියවස්වලට අයත් විය හැකි බව විශ්වාස කරනු ලබයි. කෙසේ වෙතත් ලාංකේය සඳකඩ පහණට දීර්ඝ ඉතිහාසයක් පවතින බව සේනක බණ්ඩාරණායක ප්‍රකාශකර ඇත.[14]

මේ වන විට ලංකාවෙන් හමු වී තිබෙන හොඳම සඳකඩ පහණ ලෙස සැලකෙන්නේ අභයගිරි පරිශ්‍රයේ තිබෙන බිසෝ මාළිගය ලෙසින් හඳුන්වන පිළිම ගෙය ආශ්‍රිත ව පිහිටි සඳකඩ පහණ ය. මෙම සඳකඩ පහණ ක්‍රි.ව. 8-9 සියවස්වලට අයත් වියහැකි බව විශ්වාස කරයි. මීට සමාන අලංකාර සඳකඩ පහණක් එකී පරිශ්‍රයේම දීඝපාෂාණයට දකුණු පසින් තිබෙන ගොඩනැගිලි සංකීර්ණයක දක්නට ඇත. ඒ අනුව මෙය ද එම කාලයටම අයත් විය හැකි බවට අනුමාන කිරීමට පුළුවන. බෙන්ජමින් රෝලන්ඩ් මෙරට සඳකඩපහණෙහි මෞර්ය ප්‍රභවයක් ඇතැයි පෙන්වා දෙමින් මෙරට සඳකඩ පහණ ක්‍රි.ව. 4-5 සියවස්වලින් ඔබ්බට නොයැතැයි ප්‍රකාශ කරයි. කෙසේ වෙතත් සඳකඩ පහණෙහි කැටයම් කරණයේ ආරම්භය ලෙස සැලකිය හැක්කේ ක්‍රි.ව. 6-7 සියවස් බව අනුමාන කිරීමට පුළුවන.

## සැරසිළි රටා

සඳකඩ පහණක සැරසිලි නිර්මාණය කොට ඇත්තේ නියමිත රටාවක් අනුව බව පැහැදිලි ය. මුල්කාලීන සඳකඩ පහණ් වල කිසිදු සැරසිලි මෝස්තරයක් දක්නට නොමැති අතර මතුපිට සම්පූර්ණයෙන් ම නිදහස් ස්වරූපයකින් යුක්තව නිර්මාණය කොට තිබේ. වෙස්සගිරිය වැනි ස්ථානවලින් මේ සම්බන්ධයෙන් නිදසුන් හඳුනාගැනීමට පුළුවන. ඉන් පසු වෘත්තාකාර වටරේඛා කිහිපයක් පමණක් නිර්මාණය කර තිබෙන සඳකඩ පහණ හඳුනාගැනීමට පුළුවන. සමහරක ලියවැල් මෝස්තර කිහිපයක් පමණක් දක්නට ලැබේ. ඇතැම් ඒවායේ හි දක්නට ලැබෙන්නේ මධ්‍යයෙහි පිහිටි පද්මය පමණි. ශ්‍රී මහා

14 එස්. බණ්ඩාරණායක, **'සඳකඩ පහණේ වර්ධනය', දිනමිණ වෙසක් කලාපය**, (කොළඹ: ලේක්හවුස්, 1977),

බෝධි පරිශ්‍රයේ තිබෙන සඳකඩ පහණ මෙයට නිදසුනකි. රූකම් කළ සඳකඩ පහණ අතුරින් විශිෂ්ට නිර්මාණ ලෙස අභයගිරියේ බිසෝමාළිගය ලෙසින් හැඳින්වෙන පිළිමගේ සමීපයේ තිබෙන සඳකඩ පහණ හා ශ්‍රී මහා බෝධි මළුවේ දැනට වසා දමා තිබෙන සඳකඩ පහණ ඉතාමත් වැදගත් කොට සැලකිය හැකි වේ.

ඒවායෙහි රූ කැටයම් යොදා තිබීම ඒකාකාරී රටාවක් දක්නට ලැබෙන අතර එය අනුරාධපුර යුගයේ සඳකඩ පහණක රූ කැටයම් යෙදීමේ උච්චතම අවස්ථාව ලෙසින් සැලකිය හැකි ය. එම රූ කැටයම් වල අනුපිළිවෙල පිට සිට ඇතුළට මෙය වේ.

1 → නාගදැල්ල හෙවත් ගිනිදැල්ල

2 → ඇත්, අස්, සිංහ, ගවයින්ගෙන් යුතු සත්වාවලිය

3 → ගෙඩි ගැට කොළ හා මල් වලින් යුතු ලංකාමෝස්තරය

4 → හංස පේළිය

5 → ලතා මෝස්තරය

6 → පෙති සහිත වූ පද්මය

බිසෝමාළිගය සඳකඩ පහණෙහි ඇතුළත පිහිටි පද්මයට පිටතින් හංස පේළි අතර ලියවැලක් දක්නට ලැබේ. එහෙත් දළදා මාළිගය නම් වූ ගොඩනැගිල්ලේ සහ ථූපාරාමය අසල තිබෙන ගොඩනැගිල්ලක දක්නට ලැබෙන සඳකඩ පහණ් වල පද්මයට පිටතින් ඇත්තේ හංස පේළියයි. ඊළඟට පිළිවෙලින් ලියවැල සහ පත්මාවලිය නිර්මාණය කොට ඇත. දළදා මාළිගයේ සඳකඩ පහණෙහි ඇතුන් ඉරියව් තුනකට නිර්මාණය කර ඇත.

පොළොන්නරුවෙන් සොයාගෙන තිබෙන අලංකාරම සඳකඩ පහණ පිහිටා ඇත්තේ වටදාගෙ හි ය. පළමුවන පරාක්‍රමබාහු රජු විසින් කරන ලද වටදාගෙයිහි සඳකඩ පහණෙහි පලාපෙති මෝස්තරය සහිත නෙළුම්මලෙන් අනතුරුව ලියවැල් මෝස්තරයක් දක්නට ලැබෙන අතර විශේෂත්වය වන්නේ ඉන්පසුව වෙන් වෙන් වශයෙන් පේළිවල සිංහයා, ඇති, අශ්වයා හා හංසයා නිර්මාණය කර තිබීමයි. ගවරූපය නොමැතිවීම මේ යුගයේ විශේෂත්වයක් වන අතර ගවයා සඳකඩපහණින් ඉවත්වීමෙහි ලා ආගමික හේතුන් බලපා තිබෙන බව හඳුනාගැනීමට පුළුවන. එසේ වුවත් ගවයා සහිත සඳකඩ පහණ් 2ක් පොළොන්නරුවෙන් සොයාගෙන තිබෙනු ඇති අතර ඒවා අනුරාධපුර යුගයට අයත් ඒවා බව විශ්වාස කරනු ලබයි.

## සමෝධානය

ක්‍රිස්තු වර්ෂ 13 සියවසට පසු සඳකඩපහණෙහි සැරසිලි සීඝ්‍රයෙන් වෙනස් වන ආකාරයක් හඳුනාග ැනීමට පුළුවන. අලුත් මෝස්තර එයට එකතුවන අතර ලියවැල් රටාවන් විශේෂයෙන් වැඩි වේ. සතුන් යෙදීම තව ටික කාලයක් පවතී. හොරණ සඳකඩපහණෙහි ඇතුන් 4ක් ද, හංසයින් 2ක් ද, මොණරුන් 1ක් ද, සිංහයකු ද දක්නට ලැබේ. බෙලිගල සඳකඩපහණෙහි ද මොණරාසිටි, ඔක්ගමුව සඳකඩපහණෙහි ලියවැල් හැරුණ විට ඇතුන් 12ක් නිර්මාණය කොට ඇත. එහෙත් හොරණ හා ඔක්ගමුවේ සඳකඩ පහණ්වල ස්වරූපය එතරම් කලාත්මක නොවේ.

මහනුවර යුගයේ ත්‍රිකෝණාකාර හැඩයෙන් යුතු සඳකඩ පහණ පුරාම දක්නට ලැබෙන්නේ ලියවැල් මෝස්තර රටාවකි. මධ්‍යයේ පද්මය ද එය වටා සමමිතිකව යන ආකාරයට ලියවැල් රටාව ද යොදා ඇත. දළදා මාළිගාව, මඟුල් මඩුව, දෙගල්දොරුව ආදී ස්ථාන වල තිබෙන සඳකඩ පහණ මෙයට නිදසුනකි. දළදා මාළිගාවේ තිබෙන එක් සඳකඩ පහණක බොහෝ පිරුණු අවස්ථාවක් පෙන්නුම් කරයි. එහි පද්මය වටා දක්නට ලැබෙන්නේ මෙලහින සිංහ පේළියකි. ඇතුළත නිර්මාණය කර තිබෙන පක්ෂි පේළිය ද එතරම් කලාත්මක නොවේ. ඒ අනුව පැහැදිලි වන කාරණයක් වනුයේ සඳකඩ පහණ කලාත්මක ස්වරූපය ක්‍රමයෙන් උච්චතම අවස්ථාවට පත්ව පසුව අවනතිය දක්වා ගමන් කොට තිබෙන බවයි.